# SRI LANKA COLLEGE OF PSYCHIATRISTS

"WIJERAMA HOUSE", 6, WIJERAMA MAWATHA, COLOMBO 7, SRI LANKA.
Tel: +94 11 2056493; E-mail: contactslcpsych@gmail.com
Web: www.slcpsych.lk



**Council 2023/24**

**President**
Dr Sajeewana Amarasinghe

**President Elect**
Dr.DasanthiAkmeemena

**Past President (ex-officio)**
Dr.Kapila Ranasinghe

**Vice President**
Dr.PrabathWickrama

**Secretary**
Dr. Malsha De Silva

**Assistant Secretary**
Dr. Malsha Gunathilake

**Treasurer**
Dr.Nimali Wanniarachchi

**Assistant Treasurer**
Dr.LuckshikaAmarakoon

**Editor**
Dr.DulshikaAmarasinghe Waas
Dr.Chamara Wijesinghe

**Committee Members**
Dr.Jayan Mendis
Prof.Shehan Williams
Dr.Chathurie Suraweera
Dr.Roshan Moneragala
Dr.T. Gadambanathan

**Public Relations Officer**
Dr. Nisansala Liyanage


16/11/2023

## <u>ශ්‍රී ලංකාව තුල කංසා නීතිගත කිරීම මගින් ඇතිවන අහිතකර මනෝ සාමාජයීය ප්‍රතිඵල</u>


### සාරාංශය

කංසා යනු ඇබ්බැහිකාරක මත්ද්‍රව්‍යයකි. කංසා භාවිතාව නොයෙකුත් මානසික සංකුලතා හා අපරාධ සමග බැඳී පවතී. ශ්‍රී ලංකාව තුල කංසා භාවිතාව ගැන සමාජ අපවාදයක් හෝ අපකීර්තියක් හෝ පවතී. යම් ආකාරයක කංසා නීතිගතකිරීමකින් එම අපවාදය ලිහිල් වන අතර කංසා භාවිතාව සාමාන්‍යකරණයකට ලක්වෙයි. එමගින් කංසා වලට ඇබ්බැහිවූවන්ගේ පැතිරීම විශාල ලෙස වැඩිවන අතර කංසා භාවිතාව නිසා ඇතිවන අහිතකර මනෝ සාමාජයීය ප්‍රතිඵලද විශාල ලෙස ඉහල යනු ඇත. පර්යේෂණ ප්‍රතිඵල වලට අනුව කංසා භාවිතාව සයිකෝසියාව යන උග්‍ර මානසික රෝගය ඇතිවීමේ අවදානම ඉහල දමන අතර විෂාදය, බුද්ධිමය දුර්වලතා හා නොයෙක් සාමාජයීය ගැටළු වලටද හේතු වෙයි. මොනයම් ආකාරයක හෝ කංසා නීතිගත කිරීමකට පෙර එහි සාමාජයීය හා වානිජමය ඵලදායීතාවය ගැන සූක්ෂම අධ්‍යයනයක් විද්‍යාත්මකව සිදුවිය යුතුය.


### පසුබිම

2020 දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මත්ද්‍රව්‍ය සඳහා වන කොමිෂන් සභාව කංසා IV ලේඛනයෙන් ඉවත්කිරීමට තීරණය කල අතර තව දුරටත් I ලේඛනයේ තැබීමට තීරණය කලේය. ඒ අනුව අන්තර්ජාතිකව කංසා තව දුරටත් 1961 මත්ද්‍රව්‍ය ප්‍රඥප්තියට යටත් වෙයි. 1961 මත්ද්‍රව්‍ය ප්‍රඥප්තියට අනුව I ලේඛනයට අයත් මත්ද්‍රව්‍ය අධික ඇබ්බැහිකාරක හා අපහරණයට හේතුවන හෝ එම ද්‍රව්‍යයේ පරිවර්තක මත්ද්‍රව්‍යයක් අධික ඇබ්බැහිකාරක හා අපහරණයට හේතුවන හෝ වෙයි. දැනටමත් ලොව බොහෝ රටවල කංසා වගාව, නිෂ්පාදනය, ආනයනය, අපනයනය, වෙළඳාම, ළඟ තබා ගැනීම හෝ ඖෂධ හා වෛද්‍ය පර්යේෂණ සඳහා හැර ළඟ තබා ගැනීමද තහනම්ය. ශ්‍රී ලංකාව තව දුරටත් එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය අවභාවිතාව සහ ජාවාරම වැළැක්වීමේ ප්‍රඥප්තීන් තුනටම යටත් වෙයි. එනම් 1961 මත්ද්‍රව්‍ය ප්‍රඥප්තිය, 1971 මනෝ චිකිත්සක ද්‍රව්‍ය පිලිබඳ ප්‍රඥප්තිය සහ 1988 මත්ද්‍රව්‍ය සහ මනෝ චිකිත්සක ද්‍රව්‍ය ජාවාරම් මැඩලීමේ ප්‍රඥප්තිය යන සම්මුති තුනටය. ශ්‍රී ලංකා ආයුර්වේද පනතට අනුව රට තුල ආයුර්වේද වෛද්‍යවරුන්ට පමණක් ඖෂධ නිෂ්පාදනය සඳහා කංසා ලබාගත හැක. ඖෂධයක් ලෙස භාවිත කිරීමද ඇතුළුව කිසියම් ආකාරයකින් කංසා නීතිගත කිරීමේ අවදානම ගැන තම අවධානය යොමු කරමින් ඇමෙරිකානු මනෝ වෛද්‍ය සංගමය, එක්සත් ජනපද රාජකීය මනෝ වෛද්‍ය සංගමය, ඔස්ට්‍රේලියා හා නවසීලන්ත රාජකීය මනෝ වෛද්‍ය සංගමය ඇතුළු අන්තර්ජාතික වෛද්‍ය සංගම් ගනනාවක්ම තම මතය ඉදිරිපත් කර ඇත.

# SRI LANKA COLLEGE OF PSYCHIATRISTS

"WIJERAMA HOUSE", 6, WIJERAMA MAWATHA, COLOMBO 7, SRI LANKA.
Tel: +94 11 2056493; E-mail: contactslcpsych@gmail.com
Web: www.slcpsych.lk



**Council 2023/24**

**President**
Dr Sajeewana Amarasinghe

**President Elect**
Dr.DasanthiAkmeemena

**Past President (ex-officio)**
Dr.Kapila Ranasinghe

**Vice President**
Dr.PrabathWickrama

**Secretary**
Dr. Malsha De Silva

**Assistant Secretary**
Dr. Malsha Gunathilake

**Treasurer**
Dr.Nimali Wanniarachchi

**Assistant Treasurer**
Dr.LuckshikaAmarakoon

**Editor**
Dr.DulshikaAmarasinghe Waas
Dr.Chamara Wijesinghe

**Committee Members**
Dr.Jayan Mendis
Prof.Shehan Williams
Dr.Chathurie Suraweera
Dr.Roshan Moneragala
Dr.T. Gadambanathan

**Public Relations Officer**
Dr. Nisansala Liyanage


විදයාත්මක පර්යේෂණ ප්‍රතිඵල පදනම් කර ගනිමින් කිසියම්ම හෝ ආකාරයකින් කංසා නීතිගත කිරීමේ ආදීනව ශ්‍රී ලංකා මනෝ වෛද්‍යවරුන්ගේ සංගමය ලෙස අපි පහත සඳහන් කරමු.

- යම් නීතිගත කිරීමකින් සමාජය තුල කංසා භාවිතාවට අති අවමානය ඉවත්වන අතර භාවිතාව සාමාන්‍යකරණයකට ලක්වනු ඇත.
- එය යෞවනයන් වැඩි වැඩියෙන් කංසා අත්හදා බැලීමට හේතු වෙයි.
- යෞවන වයසේදී කංසා භාවිතා කිරීම කංසා වලට ඇබ්බැහි වීමට හේතු වෙයි.
- යෞවන වයසේදී කංසා භාවිතා කිරීම අවධානය, මතකය, තේරුම් ගැනීමේ වේගව, දෘශය අවකාශ බුද්ධිය, සාමාන්‍ය බුද්ධිය ආදී සංජානනීය ක්‍රියාවලියන් කෙරෙහි අහිතකර බලපෑම් එල්ල කරයි.
- යෞවන වයසේදී නිතර කංසා භාවිතා කිරීම අවදානම් කාණ්ඩ වල මානසික රෝග ඇත්වීමේ සම්භාවිතාව වැඩි කරයි
- දිගින් දිගට කංසා භාවිතා කිරීම මානසික රෝග වලින් පෙලෙන්නන්ගේ රෝග ලක්ෂණ තීව්‍ර කරන අතර රෝගය සාමාන්‍ය ජීවිතයට ඇතිකරන බලපෑම තවත් වැඩි කරයි
- ගැබිණි මව්වරුන් කංසා භාවිත කිරීම කළල අවස්ථාවේ මොළයේ වර්ධනයට බලපාන අතර එය දරුවාගේ බුද්ධි වර්ධනයට, අධයාපනයට බලපාන අතර පසුකාලීන හැසිරීම් ගැටළුවලට හේතු වෙයි
- ශ්‍රී ලංකාවේ මනෝ වෛද්‍ය ක්ෂේත්‍රය අද වන විට සම්පත් හිඟවීම නිසාත් වෘත්තිකයන් රට හැර යාම නිසාත් දැඩි අභියෝගයන්ට මුහුණ දෙමින් සිටී. රටේ සමහර ප්‍රදේශවල මානසික රෝග වලින් පෙලෙන්නන්ගෙන් 67% ට නිසි ප්‍රතිකාර ලැබෙන්නේ නැත. එවන් පසුබිමක යම් ආකාරයක කංසා නීතිගත කිරීම නිසා වැඩිවන මානසික රෝග බලපෑමට මුහුණ දීමට මානසික සෞඛය ක්ෂේත්‍රයට නොහැකිවනු ඇත. එහි ඵල විපාක ඉතා දරුණු වනු ඇත.

# SRI LANKA COLLEGE OF PSYCHIATRISTS

"WIJERAMA HOUSE", 6, WIJERAMA MAWATHA, COLOMBO 7, SRI LANKA.
Tel: +94 11 2056493; E-mail: contactslcpsych@gmail.com
Web: www.slcpsych.lk



**Council 2023/24**

**President**
Dr Sajeewana Amarasinghe

**President Elect**
Dr.DasanthiAkmeemena

**Past President (ex-officio)**
Dr.Kapila Ranasinghe

**Vice President**
Dr.PrabathWickrama

**Secretary**
Dr. Malsha De Silva

**Assistant Secretary**
Dr. Malsha Gunathilake

**Treasurer**
Dr.Nimali Wanniarachchi

**Assistant Treasurer**
Dr.LuckshikaAmarakoon

**Editor**
Dr.DulshikaAmarasinghe Waas
Dr.Chamara Wijesinghe

**Committee Members**
Dr.Jayan Mendis
Prof.Shehan Williams
Dr.Chathurie Suraweera
Dr.Roshan Moneragala
Dr.T. Gadambanathan

**Public Relations Officer**
Dr. Nisansala Liyanage


ශ්‍රී ලංකා මනෝ වෛද්‍යවරුන්ගේ සංගමය ලෙස අපි පහත කරුණු ද අවධාරනය කිරීමට කැමැත්තෙමු.

1. කංසා කිසිම මානසික රෝග ප්‍රතිකාරයකට ඖෂධයක් ලෙස වැදගත් යැයි පර්යේෂණ ප්‍රතිඵල වලින් ඔප්පු වී  නැත.
2. භින්නෝන්මාදය වැනි උග්‍ර මානසික රෝග වැළඳීමේ අවදානම කංසා මගින් වැඩිකරයි.
3. විෂාදය, කාංසාව වැනි මානසික රෝග වැළඳීමේ අවදානම හා සුව නොවීමේ අවදානම කංසා මගින් වැඩිකරයි.
4. ඉහත දැක්වූ පරිදි කංසා යෞවන බුද්ධි වර්ධනයට බලපෑම් සිදුකරයි.
5. දිගින් දිගට කංසා භාවිත කිරීම දුප්පත්කම, අඩු අධ්‍යාපන සුදුසුකම් ලැබීම, විරැකියාව්, රාජ්‍ය ආධාර මත යැපීම, වෙනත් මත්ද්‍රව්‍ය වලට යොමුවීම හා අපරාධවලට යොමුවීම ආදී පසුකාලීන සමාජ ගැටළු වලට හේතුවෙයි.
6. ඉහළ රෝග අවධානම හා ඒ හා බැඳෙන සමාජ ආර්ථිකමය බලපෑම නිසා මොනයම් ආකාරයක හෝ කංසා නීතිගත කිරීමකට පෙර එහි සාමාජයීය හා වානිජමය ඵලදායීතාවය ගැන සූක්ෂම අධ්‍යයනයක් විද්‍යාත්මකව සිදුවිය යුතුය.

ඒ අනුව ශ්‍රී ලංකා මනෝ වෛද්‍යවරුන්ගේ සංගමය ලෙස අපි කිසිම ආකාරයක කංසා නීතිගත කිරීමක් අනුමත නොකරන අතර එවන් කිසිම නීතිගත කිරීමකට පෙර එහි එහි සාමාජයීය හා වානිජමය ඵලදායීතාවය ගැන සූක්ෂම අධ්‍යයනයක් විද්‍යාත්මකව සිදුවිය යුතු බව අවධාරණය කරමු.

| | |
|---|---|
| **Dr.Sajeewana Amarasinghe** | **Dr.Malsha De Silva** |
| President, | Secretary |

Sri lanka Collage of Psychiatrists